රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 05/97(1)

මගේ අංකය: එක්ස්ටියු/21 (111)/7,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1997 .09 .01 දින

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>රජයේ නිලධාරීන් සඳහා රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම (අග්‍රහාර)</u>

ඉහත කරුණ ගැන 1997.01.31 දතම දරන අංක 05/97 දරන චක්‍රලේඛය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. මෙම චක්‍රලේඛයේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ උපදෙස් ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොමැති බවට, මගේ අවධානයට යොමු වී ඇත. මේ නිසා තමන්ට ලැබිය යුතු රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමේ දුෂ්කරතාවයට රජයේ සේවකයින් පත්ව තිබේ.

03. මෙම තත්ත්වය වැළැක්වීම සඳහා, වහාම පියවර ගෙන, මෙම කටයුතු ඉක්මණින් නිම කිරීම සඳහා කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. මේ සඳහා පහත සඳහන් උපදෙස් පිළිපැදීමට සටහන් කර ගැනීම මැනවි.

1. චක්‍රලේඛයේ ඇමුණුම් 04 පරිදි මෙතෙක් ඉල්ලුම් පත්‍ර නිකුත් කර නොමැති නිලධාරීන් වෙත ඒ අයට අවශ්‍ය භාෂාවකින් ඉල්ලුම්පත්‍ර නොපමාව නිකුත් කිරීම.

11. ලැබී ඇති <u>ඉල්ලුම් පත්</u> අදාළ චක්‍රලේඛයේ 05 සහ 08 වැනි ජේදවල සඳහන් උපදෙස් පරිදි වහාම රක්ෂණ සංස්ථාවට ඉදිරිපත් කිරීම.
111. මෙතෙක් ඉල්ලුම් පත් යවා රක්ෂණ ඔප්පු ලැබී නොමැති නම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අවධානයට යොමු කොට ඒවා නොපමාව ගෙන්වා ගැනීම.
1V. ඔබ වෙත සපයා ඇති ප්‍රතිලාභ ලබා ගැනීමේ විස්තර පත්‍රිකා නොපමාව අවශ්‍ය නිලධාරීන් වෙත ලබා දීම.
V. ඔබ වෙත ලැබී ඇති <u>ප්‍රතිලාභ අයදුම්පත්</u> චක්‍රලේඛයේ 07 වැනි ජේදයේ සඳහන් උපදෙස් පරිදි වහාම රක්ෂණ සංස්ථාවේ ප්‍රාදේශීය වශයෙන් පිහිටා ඇති ප්‍රාදේශීය/ ශාඛා කාර්යාලවලට ඉදිරිපත් කිරීම.

V1. තම අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් සියළුම නිලධාරීන් සඳහා කොටස් වශයෙන් නොව එක්වරම රක්ෂණ ඔප්පු ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.

04. මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ද ඔබේ සැලකිල්ල යොමු කිරීම යෙහෙකි.

1. චක්‍රලේඛයේ 04 වැනි ඡේදයේ සඳහන් පරිදි සාමාජිකයකුට අවුරුදු 18 සිට 60 දක්වා නියම කර ඇති වයස් සීමාව කලත්‍රයාට ද අදාළ වේ.

11. රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයට ගැනෙන සියළුම සේවාවල ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ නිලධාරීන් මෙම රක්ෂණ ක්‍රමය සඳහා ඇතුලත් වේ.

111. මෙම රක්ෂණ ක්‍රමය යටතේ සියළුම ප්‍රතිලාභ 1997.01.01 වැනිදින සිට හිමිවේ. ඒ අනුව රක්ෂණ සංස්ථාව විසින් සියළුම ගෙවීම් එදින සිට කරනු ලැබේ.

1V. රජයේ නිලධාරීන් දෙදෙනෙකු විවාහ වී සිටින විට, ඔවුන් දෙදෙනාම වෙනුවෙන් රක්ෂණ වාරික මුදල් ගෙවන බැවින් එම දෙදෙනාටම රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ හිමිවේ. (එනම් එක් අයෙකුට රු. 50000/- බැගින් උපරිමයකට යටත්ව දෙදෙනාටම රු.100,000/- ක ප්‍රතිලාභ හිමිවේ.

V. රක්ෂණ සංස්ථාවේ ණය සුරැකුම් රක්ෂණ සහතිකය, දේපළ ණය සඳහා දැනට බලපැවැත්වේ.

V1. රජයේ ලියාපදිංචි ආයුර්වේද රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා ගෙවීම් කරනු ලැබේ.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,

,

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය